කොවිඩ් 19 සති පාසල

සබරගමුව

විෂය- භූගෝල විද්‍යාව     ශ්‍රේණිය - 09 ශ්‍රේණිය     වාරය-III

.

**පැවරුම අංක** - 07

**පුනරීක්ෂණ අභ්‍යාස** - 01

**ක්‍රියාකාරකම** - 9 ශ්‍රේණිය භූගෝල විද්‍යාව පෙළපොතට අදාළ ඒකක සියල්ල සති පැවරුම් මගින් 6 වන සතිය දක්වා ආවරණය කර ඇති බැවින් මෙම සතියේ සිට එක් එක් ඒකකයට අදාළව පුනරීක්ෂණ අභ්‍යාසවල නිරත වෙමු.

ඒකකය 01 - ආසියානු ප්‍රදේශය

පුනරීක්ෂණ අභ්‍යාස 01- ආසියාවේ භූගෝලීය පිහිටීම.

පියවර 01 - 9 ශ්‍රේණිය භූගෝල විද්‍යාව පෙළපොතේ පිටු අංක 2-4 දක්වා නැවත කියවා ගෙන පහත ප්‍රශ්නාවලිය සඳහා පිළිතුරු සපයන්න.

<u>ප්‍රශ්නාවලිය -</u>

1. ආසියානු ප්‍රදේශයේ සාපේක්ෂ පිහිටීම ලියා දක්වන්න.
2. ආසියාව යුරෝපයෙන් හා අප්‍රිකාවෙන් වෙන්වන මායිම් නම් කරන්න.
3. එම මායිම් ඇසුරින් ආසියානු ප්‍රදේශය ලෝක ආකෘති සිතියමක සේයා කර දක්වන්න.
4. ආසියානු ප්‍රදේශයට අයත් දූපත් 04 ක් නම් කරන්න.
5. මෙම ප්‍රදේශයේ නිරපේක්ෂ පිහිටීම දක්වන්න.
6. මෙම ප්‍රදේශයේ විශාලත්වය වර්ග කිලෝමීටර් කොපමණද?
7. ආසියානු ප්‍රදේශයේ සුවිශේෂතා 4ක් ලියන්න.
8. ලොව ඉපැරණි ශිෂ්ටාචාර අතර ආසියානු ප්‍රදේශයේ බිහිවී ඇති ශිෂ්ටාචාර 3 ක් නම් කරන්න.
9. ආසියා මහද්වීපයට අයත් රටවල් 10 ක් නම් කරන්න.
10. පහත සඳහන් දෑ ලෝක ආකෘති සිතියමක ලකුණු කර නම් කරන්න.
11. හිමාලයා කඳු වැටිය,ටිබෙට් සානුව,සුමාත්‍රා දූපත්,චීනය,ගෝබී කාන්තාරය,තායිවානය,හොවැංහෝ ගංගාව,පාකිස්ථානය,ඉන්දු ගංගාව,මැන්චූරියානු තැන්න.

සැකසුම - එම්.බී.එන්.දිල්හානි මිය
ර/නිවි/කෙහෙල්ඕවිටිගම විදුහල (නිවිතිගල අ.ක)